# වඳවීයන අපේ ජෛව විවිධත්වය

දක්ෂණී පෙරේරා
පරිසර කළමනාකරණ නිලධාරිනී
පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය

ඉහළ ජෛව විවිධත්වයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව ඉන්දියාවේ වෙස්ටන් ගාට්ස් ප්‍රදේශය සමග ලෝකයේ ජෛව විවිධත්වය අතින් උණුසුම් කලාප 35න් එකක් ලෙස හඳුනාගෙන ඇත. එසේම මෙරට හඳුනාගෙන ඇති ශාක සහ සත්ව විශේෂ අතර ශ්‍රී ලංකාවට ආවේනික (ශ්‍රී ලංකාවෙන් පමණක් හමුවන) විශේෂ ගණනද සැලකිය යුතු ලෙස ඉහල අගයක් ගනී. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම 2016 අනුව ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පහත දැක්වේ.

| කාණ්ඩය | ශ්‍රී ලංකාවේ වාර්තාගත විශේෂ | | | | | |
|---|---|---|---|---|---|---|
| | මුළු | දේශීය | අවේනික | සාගරික | සංචාරක | විදේශික |
| භෞමික ගොළුබෙල්ලන් | 254 | 230 | 203 | 0 | 0 | 24 |
| ගෝනුස්සන් | 18 | 18 | 14 | 0 | 0 | - |
| සියපදිකයන් | 23 | 23 | 3 | 0 | 0 | - |
| බත්කූරන් | 124 | 124 | 48 | 0 | 0 | 0 |
| සමනළයින් | 245 | 245 | 26 | 0 | 0 | 0 |
| බඹරුන් | 130 | 130 | - | 0 | 0 | - |
| මිරිදිය කකුළුවන් | 51 | 51 | 50 | 0 | 0 | 0 |
| මිරිදිය මසුන් | 119 | 92 | 55 | 0 | 0 | 27 |
| උභය ජීවින් | 119 | 119 | 105 | 0 | 0 | 0 |
| උරගයින් | 217 | 217 | 131 | 21 | 0 | 1 |
| පක්ෂීන් | 498 | 221 | 34 | 0 | 276 | 1 |
| ක්ෂීරපායින් | 141 | 129 | 21 | 33 | 0 | 12 |
| ආවෘත බීජක ශාක | 4,203+ | 3,103+ | 889+ | 0 | 0 | 1,100+ |
| විවෘත බීජ ශාක | 35+ | 2 | 0 | 0 | 0 | 33+ |
| මීවන | 336 | 321 | 49 | 0 | 0 | 15+ |
| පාසි | 560+ | 560 | 66+ | 0 | 0 | - |
| අක්මා ශාක | 222 | 222 | - | 0 | 0 | - |
| ලයිකන | 661 | 661 | - | 0 | 0 | - |
| **මුළු විශේෂ ගණන** | **7,828+** | **6,338+** | **1,691+** | **54** | **276** | **1,212+** |



මේ අනුව සැළකීමේදී ඉහළම අවේනිකතාවයක් වාර්තා වන්නේ මිරිදිය කකුළුවන් අතරිනි. එනම් ශ්‍රී ලංකාවේ හමුවන මිරිදිය කකුළුවන් 98.04%ක් අවේනික වේ. එසේම උභයජීවීන් 87.39%ක්, භෞමික ගොළුබෙල්ලන් 79.92%ක්, උරගයින් 59.45%ක්, මිරිදිය මසුන් 46.22%ක්, බත්කූරන් 38.40%ක්, ක්ෂීරපායීන් 19.44%ක්, සමනලුන් 10.57%ක් හා පක්ෂීන් 6.83%ක් අප රටට පමණක් අවේනිකය. මෙරට දේශීය ශාක ප්‍රජාව සැළකීමේදී ආවෘත බීජක ශාක 21.21%ක් හා මීවන 14.58%ක් ශ්‍රී ලංකාවට අවේනික ලෙස හඳුනාගෙන ඇත.

භූ විෂමතාවය, දේශගුණය, ජලයේ සුලභතාවය, ගොන්ඩ්වනාලන්තයේ සිට වර්තමාන මහද්වීප ව්‍යුහය දක්වා විකාශනය වීමේ ක්‍රියාවලියේදී විවිධ භූ කලාප (land masses) සමග සම්බන්ධ වී තිබීම හා දුපතක් වීම යන කරුණු මෙසේ ඉහළ ආවේනිකතාවයක් ඇති වීමට හේතු වී ඇති බව සැලකේ.

ජෛව විවිධත්ව උණුසුම් කලාපයක් (Biodiversity Hot spot) වීම සඳහා නිර්ණායක දෙකක් සපුරාලිය යුතුය. එනම් සනාල ශාක 1500ක් හෝ 0.5%ක් අවේනික



ස්වභාවික වනාන්තර වලින් තුරන් වී ඇති
*Alphonsea hortensis*

විශේෂයන් වීම හා විශේෂ වැඩි ගණනක් වඳ වී යාමේ තර්ජනයට ලක් කරමින් වන ආවරණය 70% අඩු වීමට ලක් වීමයි. ඉහළ ආවේනිකතාවය ඉහළ ජෛවවිවිධත්වය මෙන්ම වඳ වී යාමේ තර්ජනයට ලක් වූ ශාක හා සත්ව විශේෂවල ඉහළ අගය ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව උණුසුම් කලාපයක් බවට පත් වීමට හේතු සාධක වී ඇත.

2012 ජාතික රතු දත්ත ලේඛනය අනුව ශ්‍රී ලංකාවේ ඇති සපුෂ්පක ශාක අතුරින් 1385ක් එනම් 43.9% ක් වඳවියාමේ තර්ජනයට ලක් වී ඇත. එම වාර්තාවට අනුව දැනට හඳුනාගෙන ඇති විශේෂ අතුරින් 5 ක් එනම් *Strobilanthes caudate, Blumea angustifolia, Crudia zeylanica, Rinorea bengalensi, Rinorea decora* විශේෂ ශ්‍රී ලංකාවෙන් වඳ වී ඇත. එසේම *Alphonsea hortensis* හා *Doona ovalifolia* විශේෂ ශ්‍රී ලංකාවේ ස්වභාවික වනාන්තර වලින් තුරන් වී ඇතත් උද්භිද උද්‍යානවල වගා කොට ඇත. ශ්‍රී ලංකාවේ ඇති මීවන විශේෂ අතුරින් 200 ක් එනම් 59.5%ක් වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇත.

සත්ව විශේෂ සැලකීමේදී 2012 ජාතික රතු දත්ත ලේඛනයට අනුව පෘෂ්ඨවංශික සත්ව කාණ්ඩ අතුරින් ක්ෂීරපායි විශේෂ 53ක් (19.44%), පක්ෂීන් විශේෂ 54ක් (6.83%), උරග විශේෂ 107ක් (59.45%), උභයජීවී විශේෂ 72ක් (87.39% ) හා මිරිදිය මත්ස්‍ය විශේෂ 43ක් (46.22%) එසේම අපෘෂ්ඨවංශි සත්ව කාණ්ඩ වන භෞමික ගොළුබෙල්ලන් විශේෂ 165ක් (79.92%), සමනලුන් විශේෂ 96ක් (10.57%), බිඟුන් විශේෂ 106ක්, කුහුඹුවන් විශේෂ 59ක් (28,78%), බත් කූරන් විශේෂ 61ක් (38.4%), මිරිදිය කකුළුවන් විශේෂ 46ක් (98.04%) හා මකුළුවන් විශේෂ 62ක් (12.37%) වඳවී යාමේ තර්ජනයට ලක් වී ඇත.



ස්වභාවික වනාන්තර වලින් තුරන් වී ඇති
*Doona ovalifolia*

ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද එම ප්‍රමාණයේ රටවල්වල හමු නොවන ආසියානු අලියා, වලසා, කොටියා වැනි විශාල ප්‍රමාණයේ සතුන් රැසකට වාසභූමිය වී ඇත. එසේම දැනට ලොව හමුවන විශාලම ක්ෂීරපායී විශේෂය වන යෝද නිල් තල්මසා (*Balaenoptera musculus*) ශ්‍රී ලංකා මුහුදේ හමුවන අතර එමෙන්ම හඳුනාගෙන ඇති පිග්මි මියා (*Suncus etruscus*) ශ්‍රී ලංකාව සිය නිවහන කර ගෙන ඇත.




යෝධ නිල් තල්මසා




පිග්මි මීයා

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව ව්‍යාප්තියද ඒකාකාර නොවේ. ශ්‍රී ලංකාවේ ආවෘත බීජක ශාක විවිධත්වය සැලකීමේදී ඉහළම විවිධත්වයක් පෙන්වනුයේ මහනුවර සහ රත්නපුර දිස්ත්‍රික්කයි. ශ්‍රී ලංකාවේ පෘෂ්ඨවංශික සත්ව විවිධත්වය සැලකීමේදී වැඩිම විශේෂ සංඛ්‍යාවක් වාර්තා වන්නේ ගාල්ල, රත්නපුර, හා මහනුවර දිස්ත්‍රික්ක වලය. සමස්තයක් ලෙස ගත් කළ තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවල ශාක හා සතුන්ගේ ඉහළ විවිධත්වයක් දැකිය හැකි බව පෙනේ. තර්ජනයට ලක් වූ අවේනික විශේෂ වලින් 75% ක් පමණ තෙත් කලාපයට සීමා වී ඇත. නමුත් එම තෙත් කලාපයේ වනාන්තර පසුගිය වසර 150ක පමණ සිට වගා බිම් හා වාසස්ථාන සඳහා එළි කිරීම නිසා උග්‍ර හායනයකට ලක්ව ඇත. 2010 වසරේදී සිදුකල සමීක්ෂණ වාර්තාවලට අනුව තෙත් කලාපයේ වන වැස්ම මුළු වන ගහණයෙන් 3%ක් පමණය. එසේම පවතින වනාන්තරයද කුඩා කැබලි ලෙස පවතින අතර තවදුරටත් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද හායනය වීම රටේ ජෛව විවිධත්වයට විශේෂයෙන්ම අවේනික විශේෂ විවිධත්වයට හානි කර වී ඇත.




ශ්‍රී ලංකාවේ ආවෘත බීජක ශාක ව්‍යාප්තිය




ශ්‍රී ලංකාවේ වඳවී යාමේ තර්ජනයට ලක් වූ පෘෂ්ඨ වංශී සත්ව ව්‍යාප්තිය